යම් කිසි ප්‍රවෘත්ති වාර්තාවක් පළ කිරීමේදී, එහි අඩංගු කරුණු වලට පදනම් වූ මූලාශ්‍ර හෙළිකිරීමට මූලාශ්‍රයෙන් අවසරයක් නොලැබෙන අවස්ථාවකදී, මූලාශ්‍රයේ අනන්‍යතාවය මාධ්‍යවේදියා විසින් ආරක්ෂා කළ යුතු බවට විවාදයක් නොමැත. නමුත් එවන් අවස්ථාවකදී පවා තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතු වේ. මෙය අනිද්දා පුවත්පතේ ලිපියක (අලුත් අනතුරු සංඥා කියාදෙන මාධ්‍යවේදියා අත්අඩංගුවට ගැනීම - 2020.09.06) මාධ්‍යවේදී ලසන්ත රුහුණගේ විසින්ද පෙන්වා දී තිබිණි.

මේ හැරෙන්නට අනෙක් හැකි සෑම අවස්ථාවකදීම මූලාශ්‍රයන් පළ කරනා ලෙසින් මාධ්‍යවේදීන්ව දිරිමත් කෙරෙන්නේ පුවත් වාර්තාවේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහායි. එසේම මූලාශ්‍ර නොදක්වා සිතා මතාම අසත්‍ය හා නොමග යවන සුළු කරුණු ඉදිරිපත් කිරීමටද හැකියාවක් තිබීම නිසාද, මූලාශ්‍රයන් සඳහන් කිරීම වැදගත් වේ.

මේ සඳහා උදාහරණ ලෙසින් "එන්ජීඕ හුළං බස්සන කෙටුම්පත ඉදිරි දෙමස තුළ මැතිසබයට" යන මැයෙන් දිවයින පුවත්පත මගින් ඉදිරිපත් කර තිබූ පුවත් වාර්තාව ගත හැක. එහි විවිධ ප්‍රකාශයන් කිහිපයක්ම ඇතුළත් වන අතර, ඒ එකකට හෝ මූලාශ්‍ර සපයා නැත.

එසේ නම්, මෙම පුවතේ කරුණු වලට විශ්වාසනීය මූලාශ්‍ර පදනමක් තිබේ දැයි පාඨක අප ඇසිය යුතු වේ. යම් හෙයකින් ලිපිය තුළ මූලාශ්‍ර සඳහන් නොවූවත්, මෙම කරුණු සඳහා නිසි මූලාශ්‍ර පදනමක් නැති නම්, එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද යන්නද අප එලෙසින්ම විමසිය යුතු වේ.

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina**